ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

DRP

# ලංසු ආරාධනය (IFB)

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ PABX පද්ධතිය හා ඊට ආදාල IP දුරකථන 652 ක් වසරක කාලයකට නඩත්තු සහ සේවා කිරීම සඳහා වන ප්‍රසම්පාදනය

**IFB අංකය : DRP/ACC/07/36/2024**

01. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ PABX පද්ධතිය හා ඊට ආදාල IP දුරකථන 652 ක් වසරක කාලයකට නඩත්තු සහ සේවා කිරීම සඳහා වන ප්‍රසම්පාදනය** වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

02. මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුව සිදු කෙරේ. (NCB)

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, සුහුරුපාය ගොඩනැගිල්ලෙහි 12 වන මහලේ සී පර්යන්තයේ පිහිටි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් දුරකතන අංක **011-5226172** ඔස්සේ වැඩි දුර තොරතුරු ලබාගත හැකි ය. එමෙන්ම ඉහත ලිපිනයෙහි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයෙහි තබා ඇති ලංසු ලේඛන **2025.07.24** සිට **2025.08.07** දින දක්වා නොමිලේ පරීක්ෂා කළ හැකි අතර එම ලංසු ලේඛනය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි **(www.drp.gov.lk)** පල කර ඇත.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **2025.07.24** සිට **2025.08.07** දක්වා **වැඩ කරන දිනවල පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා කාලය තුළ නැවත නොගෙවනු ලබන **ශ්‍රී ලංකා තුන්දහස් පන්සියයක (3,500/=)** ගාස්තුවක් මුදලින් ගෙවා ගණකාධිකාරී (ප්‍රසම්පාදන), පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සී පර්යන්තය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබා ගත හැකි ය.

05. **2025.08.11** දින **ප.ව. 2.00 හෝ ඊට පෙර**, **"මුල් පිටපත"** සහ **"පිටපත"** ලෙස සටහන් කරමින්, පිටපත් දෙකින් යුතුව මුද්‍රා තැබූ එක් ලියුම් කවරයක බහා 3 ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලංසු ලැබෙන්නට සැලැස්විය යුතු ය, නැතහොත් **ගිණුම් අංශය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සී පර්යන්තය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයේ සිට **දින හැත්තෑ හතක (77)** කාලයක් හෝ මිල දී ගන්නා විසින් දීර්ඝ කරන දිනයක් දක්වා ලංසු වලංගු විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ලබාගැනීම අවසන් වූ වහාම පැමිණීමට අපේක්ෂා කරන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

06. ලංසුව බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ ලංසු කැඳවීමේ අංකය සඳහන් කළ යුතු ය. සියලුම ලංසු, ශ්‍රී ලංකාවේ මහා බැංකුවේ ලියාපදිංචි ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද **ශ්‍රී ලංකා රුපියල් හැට දහසක (60,000/=)** ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතුය. එය කොමසාරිස් ජෙනරාල්වරයාට පක්ෂව ලියා ඇති පළමු ඉල්ලීම මත මුදල් කළ හැකිය. ලංසු සුරක්ෂණය **2025.08.12** සිට **2025.11.24** දක්වා වලංගු විය යුතු අතර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සරෆ් වෙත ආපසු ගෙවිය හැකි මුදල් තැන්පතුවක් ද තැබිය හැක.

07. තෝරාගන්නා ලංසුකරු **2025.10.09** දින සිට සේවාව ආරම්භ කළ යුතුය.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,**
12 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

SELACINE